ශ්‍රී ලංකා මහ බැංකුව

# ප්‍රාදේශීය පුවත්-මාතර සඟරාව



2019 July - Dec

Volume 05

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අර්ධ වාර්ෂික සඟරාව

# රූපලාවණ්‍ය ශිල්පීන්ට ප්‍රායෝගික පුහුණුව

දකුණු පළාතේ දියුණු කිරීමට ශක්‍යතාවක් ඇති ව්‍යාපාර ක්ෂේත්‍රයක් ලෙස අප විසින් හඳුනාගෙන ඇති රූපලාවණ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා මේ වසරේ දී වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර, එහි තෙවන වැඩසටහන ලෙස "මනාලියන් ඇන්දවීම, හැඩගැන්වීම හා කොණ්ඩා මෝස්තර පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක්" 2019 ජූලි මස 23 වන දින වැලිගම "ටුවෙන්ටි ටූ බිනවැලි" හෝටලයේ දී රූපලාවණ්‍ය ශිල්පිනියන් 25 දෙනෙකුගේ සහ ඔවුන්ගේ නිරූපිකාවන්ගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හලුන්ගේ මහතා රූපලාවණ්‍ය ශිල්පිනියන් අමතමින්



ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී හසිනි ගුණසේකර මහත්මිය විසින් රූපලාවණ්‍ය ශිල්පිනියන් අමතමින්

මෙවර ද මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයනු ලැබුවේ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී හසිනි ගුණසේකර මහත්මිය වන අතර, මෙම වැඩසටහන තුළ දී මනාලියන් ඇන්දවීම, හැඩගැන්වීම හා කොණ්ඩා මෝස්තර පිළිබඳව පෙර පැවති වැඩසටහන්වල දී ලබා දුන් න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිතා කරන ආකාරය පිළිබඳව අවබෝධය ලබා දෙන ලදී. ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටළුවලට විසඳුම් ඉදිරිපත් කිරීම, අඩුපාඩු හඳුනාගැනීම සහ ඔවුන්ගේ සේවය වඩාත් ගුණාත්මකව ලබා දීම සඳහා අවශ්‍ය වන උපදෙස් හසිනි ගුණසේකර මහත්මිය විසින් ලබා දෙන ලදී.

එහි දී රූපලාවණ්‍ය ශිල්පිනියන් හසිනි ගුණසේකර මහත්මියගේ පූර්ණ අධීක්ෂණය යටතේ මනාලියන් හැඩගැන්වීම සිදුකළ අතර, එක් එක් රූපලාවණ්‍ය ශිල්පිනියගේ හැඩගැන්වීම් ඔප් නැංවිය යුතු ආකාරය පිළිබඳව, නවීන තාක්ෂණික මෙවලම් සහ නව ආලේපන පිළබඳව ද රූපලාවණ්‍ය ශිල්පිනියන්ව දැනුවත් කරන ලදී. මනාලියන් හැඩගැන්වීම අවසානයේ මනාලියන් දැක්මක් ද පවත්වන ලදී.



ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී හසිනි ගුණසේකර මහත්මිය මනාලියන් හැඩගැන්වීම අධීක්ෂණය කරමින් නිවැරදි ක්‍රමවේදය ඔවුන් වෙත පහදා දෙමින්

# රූපලාවණ්‍ය ශිල්පීන්ට ප්‍රායෝගික පුහුණුව



හැඩගැන්වූ මනාලියක්



ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී හසිනි ගුණසේකර මහත්මිය විසින් හැඩගැන්වූ මනාලියකගේ අඩුපාඩු පෙන්වා දෙමින්



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා හැඩගැන්වූ මනාලියන් සහ රූපලාවණ්‍ය ශිල්පීන් අමතමින්





හැඩගැන්වූ මනාලියන් හා සහභාගී වූ රූපලාවණ්‍ය ශිල්පිනියන්

## රස මවන හෙළ බොජුන්හල්...

දේශීය ආහාරයෙන් සමාජය ඈත් වූ දා පටන් බොහෝ දෙනා බෝ නොවන රෝගවල ගොදුරු බවට පත් වූ බව නොරහසකි. මේ පිළිබඳව මැසිවිලි නගනවා වෙනුවට තත්ත්වයෙන් උසස් ප්‍රමිතිගත දේශීය ආහාර නිෂ්පාදනය සිදුකරන වෙළඳසැල් ගොඩනැංවීම පිළිබඳ අපගේ අවධානය යොමුවිය.

ඒ අනුව, එහි ප්‍රථම වැඩසටහන 2019 මැයි මස 30 දින පැවැත්වූ අතර, එහි දී බොජුන්හලක් පවත්වාගෙන යන ආකාරය, පිරිසිදුකම හා පිළිවෙල, ගුණාත්මකභාවය සහ පෝෂණය, පාරිභෝගික ආකර්ෂණය, අලෙවි කටයුතුවල නිරත වෙමින් ගනුදෙනු සටහන් තබා ගැනීම, සාමූහික වගකීම, බලපවත්නා නීති රීති සහ කසල කළමනාකරණය යන කරුණු ඔස්සේ ව්‍යවසායකයන් දැනුවත් කිරීම සිදුකරන ලදී.

එහි දෙවන වැඩසටහන 2019 ඔක්තෝබර් 18 දින පැවැත්වූ අතර මෙම වැඩසටහනේ දී දේශීය ආහාර කිහිපයක් ප්‍රමිතිගතව සාදාගන්නා ආකාරය පිළිබඳව ප්‍රායෝගිකව දැනුවත් කිරීම සිදු වූ අතර, ආදර්ශ හෙළ බොජුන්හලක් නිරීක්ෂණය කිරීමට ව්‍යවසායකයින්හට අවස්ථාව ලබා දුනි. මෙම වැඩසටහන සඳහා මාතර දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් අවශ්‍ය සම්පත්දායකත්වය ලබා දුන් අතර මාතර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සහයෝගය ඇතිව වැඩසටහන සංවිධානය කරනු ලැබුණි. තෙලිජ්ජවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැවති මෙම වැඩසටහන සඳහා ආහාර නිෂ්පාදනයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 26 ක් සහභාගී වූහ. මෙම වැඩසටහන්වලට සහභාගීවූ ව්‍යවසායකයන්හට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අලෙවිසැල් ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සහ මඟපෙන්වීම මෙම වැඩසටහන් හරහා සිදුවූ අතර මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක කුඩා පරිමාණයේ බොජුන්හල් ආරම්භ කොට ඇත.



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා ව්‍යවසායකයන් අමතමින්



ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා ව්‍යවසායකයන් අමතමින්



දේශීය ආහාර නිෂ්පාදනය පිළිබඳ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයීය නිලධාරිනියන් විසින් ව්‍යවසායකයන් දැනුවත් කරමින්

# සෞභාග්‍යා ව්‍යවසායක සංගමයේ ව්‍යවසායකයන්හට අලෙවිකරණ උපාය මාර්ග ඇතුළත් ව්‍යාපාරික සැලැස්මක් සැකසීම සඳහා දැනුවත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සහ මාතර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරනු ලබන මාතර දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ එකතුවෙන් සැදුම්ලත් "සෞභාග්‍යා ව්‍යවසායක සංගමයේ" ව්‍යවසායකයන් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් රාශියක් මේ වසර තුළ දී පවත්වන ලදී.

විවිධ අධ්‍යාපනික මට්ටම්වල සිටින මෙම ව්‍යවසායකයන්ගේ එකිනෙකාට ආවේණික ගැටළු හඳුනාගැනීමට හා අලෙවිකරණ උපාය මාර්ග හඳුනාගැනීමට රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය සහ මාතර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සහයෝගය ලබා ගනිමින් වැඩපිළිවෙලක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස මූලික සාකච්ඡාමය වැඩසටහනක් 2019 ජනවාරි මස 29 දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැත්වූ අතර, එහි දෙවන අදියර 2019 අගෝස්තු මස 07 දින රුහුණ විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී. මෙහිදී තෝරාගත් ව්‍යවසායකයන් 19 දෙනෙක් විශ්වවිද්‍යාල සිසුන් (98) දෙනෙකු හරහා එනම්, විශ්වවිද්‍යාල සිසුන් 05 දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායම් විසින් අධීක්ෂණය සඳහා යොමු කරන ලද අතර, එක් එක් ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරික අවශ්‍යතා සහ අලෙවිකරණ උපායමාර්ග හඳුනාගෙන ව්‍යවසායකයන්හට ව්‍යාපාරික සැලැස්මක් සකස් කර දීමට ඔවුන් වෙත පවරන ලදී.

**_2019.08.07 දින රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ දී පවත්වන ලද වැඩසටහන_**



ප්‍රාදේශීය කළමනාකාරතුමා වැඩසටහන පිළිබඳ අදහස් දක්වමින්




ව්‍යවසායිකාවක් විශ්වවිද්‍යාල සිසුන් සමග තම ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳ පැහැදිලි කරමින්



වැඩසටහන සඳහා සහභාගී වූ විශ්වවිද්‍යාල සිසුන් සහ ව්‍යවසායකයන්

# සෞභාග්‍යා ව්‍යවසායක සංගමයේ ව්‍යවසායකයන්හට අලෙවිකරණ උපාය මාර්ග ඇතුළත් ව්‍යාපාරික සැලැස්මක් සැකසීම සඳහා දැනුවත් කිරීම

කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අලෙවිකරණ දෙපාර්තමේන්තුවේ අවසන් වසර සිසුන්ගේ අධ්‍යයන කටයුතුවල එක් විෂය ප්‍රධාන පැවරුම ලෙස මෙය සිදුකරන ලද අතර, ඒ තුළින් අනාගත ව්‍යවසායකයින් බවට පත්වීමට සූදානම් වන ඔවුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමටත් හැකියාව ලැබුණි.

ඒ අනුව, ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර නිරන්තර නිරීක්ෂණය කරමින් හා ඔවුන් සමග සංවාද පවත්වමින් ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අලෙවිකරණ උපායමාර්ග ඇතුළත් ව්‍යාපෘති සැලැස්මක් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සකස් කළ අතර, එම ව්‍යාපෘති සැළසුම් 2019 නොවැම්බර් මස 08 දින රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨ ශ්‍රවණාගාරයේ දී විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, මහ බැංකු නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ බැංකු නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ සමෘද්ධි නිලධාරීන්, ප්‍රසිද්ධ ව්‍යාපාරිකයින් සහ අලෙවිකරණ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් මණ්ඩල 02ක් ඉදිරියේ ඉදිරිපත් කරන ලදී. එම නිලධාරීන් විසින් විශ්වවිද්‍යාල සිසුන් විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති සැලසුම් ඇගයීම සිදුකළ අතර, සිසුන් ඉදිරිපත් කරන ලද එක් එක් ව්‍යවසායකයාගේ ව්‍යාපාරික සැලසුම ප්‍රායෝගිකව යෙදවීමේ හැකියාව පිළිබඳව සාකච්ඡාවක් ද අදාල ව්‍යවසායකයා සිසුන් සමගින් මෙහිදී සිදුකරන ලදී.

## *2019.11.08 දින රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ දී පවත්වන ලද වැඩසටහන*



විශ්වවිද්‍යාල සිසුන් අලෙවිකරණ සැලසුම් ඉදිරිපත් කරමින්



ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා විශ්වවිද්‍යාල සිසුන්ගේ අලෙවිකරණ සැලසුම් පිළිබඳ අදහස් දක්වමින්



අධීක්ෂණ කමිටුව විසින් විශ්වවිද්‍යාල සිසුන්ගේ අලෙවිකරණ සැළසුම් පිළිබඳ අදහස් දක්වමින්

## අන්තර්ජාතික වෙළඳාමට අත්වැලක්...

අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධ මූල්‍ය සේවාවන් පිළිබඳව එම සේවාවන් ලබා දෙන බැංකු ආයතනවල නිලධාරීන් තුළ ඇති දැනුමේ මදභාවය හේතුවෙන් අන්තර්ජාතික වෙළඳ කටයුතුවල (ආනයන හා අපනයන කටයුතුවල) නිරත බොහෝ ව්‍යවසායකයන්හට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන බව අපගේ නිරීක්ෂණයට ලක් විය. මෙයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජගිරිය බැංකු විදු පියස සමග ඒකාබද්ධව දකුණු පළාතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද "අන්තර්ජාතික වෙළඳාම හා සම්බන්ධ මූල්‍ය සේවාවන්" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2019 සැප්තැම්බර් මස 04 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශිය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා 52 ක පිරිසක් සහභාගී වූහ. මෙම වැඩසටහන සඳහා හබීබ් බැංකු සමාගමේ වෙළඳ සේවා අංශයේ හිටපු කළමනාකරු රිෂාඩ් අමීර් මහතා විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදී.



රිෂාඩ් අමීර් මහතා විසින් දේශනය පවත්වමින්



රිෂාඩ් අමීර් මහතා විසින් දේශනය පවත්වමින්



දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වූවන්ගෙන් කොටසක්

## බදු ගැන දැනුවත් කරන්න, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මාතරට...

බදුකරණයේ මූලික අරමුණ වනුයේ රජයේ පොදු වියදම් සඳහා වූ අරමුදල් රැස්කර ගැනීමයි. ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙනුවෙන් රජය විසින් සේවාවන් රැසක් නොමිලේ හෝ සහනදායී මිල ගණන් යටතේ සපයනු ලැබේ. එනිසා පොදු වියදම් සඳහා අරමුදල් රැස්කිරීම බදුකරණයේ මූලිකම කාර්යය වේ. ඒ අනුව, රටේ ඉදිරි සංවර්ධනය වේගවත් කිරීම උදෙසා බදුකරණය විශාල දායකත්වයක් දක්වනු ලබයි.

කරුණු එසේ වුවත් ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දේශීය ආදායම් බදු පනතේ ඇතුළත් ඇතැම් කරුණු පිළිබඳව ඇති නොදැනුවත්කම හේතුවෙන් ඔවුන් විවිධ දුෂ්කරතාවයන්ට ලක්වන බව අපගේ නිරීක්ෂණයට ලක් විය. මේ නිසා ව්‍යවසායකයන්ගේ බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාවය අධෛර්යට පත්වීම මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම සිදු වනු දැක ගත හැක. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික් වෙළඳ සංගමය සහ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මාතර දිස්ත්‍රික්කයේ තෝරා ගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා "බදුකරණය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ඔක්තෝබර් මස 04 වන දින මාතර හේමාලි උත්සව ශාලාවේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා මාතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 600 කට ආසන්න පිරිසක් සහභාගී වූහ. මෙම වැඩසටහන සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් නදුන් ගුරුගේ මහතා සහ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් එම්. ජේ. ගුණසිරි මහතා ඇතුළු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් විසින් සම්පත්දායකත්වය ලබා දුන් අතර ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා ද වැඩසටහනට සහභාගී විය.



ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙනුවෙන් අදහස් දැක්වීම



දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් නදුන් ගුරුගේ මහතා අදහස් දක්වමින්



දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් එම්. ජේ. ගුණසිරි මහතා අදහස් දක්වමින්


වැඩසටහන සඳහා සහභාගී වූවන්ගෙන් කොටසක්

# ජාවා බතික් කලාව හික්කඩුවටත්....

හික්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ බතික් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 23 දෙනෙක් සඳහා ජාවා බතික් කලාව පිළිබඳව නව තාක්ෂණික දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා දීමේ පුහුණු වැඩසටහනක් 2019 අගෝස්තු මස 08 දින හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සහ 2019 අගෝස්තු මස 13 දින හික්කඩුව අල්පොන්සු බතික් පරිශ්‍රයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය ලබා දෙන ලද්දේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසිනි. මෙහි දී ව්‍යවසායකයන්ට ජාවා බතික් කලාවේ දී භාවිතයට ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳව හඳුන්වා දෙමින් රෙදිකඩ මත චිත්‍ර ඇඳීම, අවශ්‍ය පරිදි මෝස්තරය ඉටි කිරීම, ඉටි කරගත් මෝස්තරය වර්ණ ගැන්වීම, වර්ණ ගැන්වූ මෝස්තරය මත ඉටි ගැල්වීම, නැප්තෝල් ඩයි වර්ණ ගැන්වීම සහ ඉටි දියකර හැර නිර්මාණය අවසන් කිරීම දක්වා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.




හික්කඩුව ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරිනී පිරිස පිළිගනිමින්



ව්‍යවසායකයන් ඉටි කරගත් මෝස්තරය වර්ණ ගන්වමින්



පළමු දින අවසානයේ නිර්මාණයන් සමග



ව්‍යවසායකයන් මෝස්තරය නැප්තෝල් ඩයි වර්ණ ගන්වමින්



පුහුණු වැඩසටහන අවසානයේ නිර්මාණයන් සමග

# ණයක් ගැනීමට ව්‍යාපෘති වාර්තාව හරස් වෙලා ද ?...

වර්තමානයේ විශාල වශයෙන් සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කරනු දැකිය හැකි වුවත් එම ව්‍යාපාර දිගුකාලීනව පවත්වාගෙන යාමට හෝ මධ්‍ය හෝ මහා පරිමාණ ව්‍යාපාර බවට පත් කර ගැනීමේ දුර්වලතාවයක් පවතින බව අපගේ නිරීක්ෂණයට ලක් විය. එහි දී බොහෝ සුළු පරිමාණ ව්‍යාපාරයන්හි පවතින ප්‍රාග්ධන හිඟකම එම ව්‍යාපාරවල වර්ධනය අඩාල වීමට සෘජුවම බලපෑමක් සිදු කරයි. එයට විසඳුමක් ලෙස ව්‍යවසායකයන් අයෝජනය කිරීමේ දී ණය පහසුකම් ලබා ගැනීමට යොමු වනු දැක ගත හැක. මෙසේ ව්‍යවසායකයන් බැංකු හා මූල්‍ය ආයතනවලින් ණය අයදුම් කිරීමේ දී ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීමට සිදු වන අතර එහි දී බොහෝ ව්‍යවසායකයන්හට මෙම ව්‍යාපෘති වාර්තා සකස් කිරීමට අවශ්‍ය දැනුම නොමැති වීමෙන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු දැක ගත හැකි විය.

ඒ අනුව, එයට විසඳුමක් ලෙස නිවැරදිව ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම පිළිබඳ දැනුම ව්‍යවසායකයන් අතරට ගෙන යාමේ අරමුණින් ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සමග නිරන්තරයෙන් කටයුතු කරන සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරීන්ට ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් 2019 සැප්තැම්බර් මස 27 වන දින ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සංවර්ධන නිලධාරීන් 78 ක් සහභාගී වූහ. සංවර්ධන නිලධාරීන් සඳහා මෙම පුහුණුව ලබා දීම තුළින් ඔවුන් සමග කටයුතු කරන ව්‍යවසායකයන්ට අවශ්‍ය දැනුම සම්ප්‍රේෂණය කිරීමට බලපොරොත්තු වෙයි. මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයන ලද්දේ මහජන බැංකුවේ මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ සුළු හා මධ්‍ය පරිමාණ ණය අංශයේ නියෝජ්‍ය කළමනාකරු රසික නාගොඩ මහතා විසිනි.


රසික නාගොඩ මහතා විසින් දේශනය පවත්වමින්


වැඩසටහන සඳහා සහභාගී වූවන් ගැටළු ඉදිරිපත් කරමින්


සහභාගී වූවන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දෙමින්


පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූවන්ගෙන් කොටසක්

# පාරිභෝගික තෘප්තිය තුළින් ලාභ උපරිම කර ගනිමු...

ව්‍යාපාරයක් සාර්ථක වීම පිණිස එම ව්‍යාපාරය වෙත නව පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම මෙන්ම දැනට සිටින පාරිභෝගිකයන් රැක ගැනීම ද අත්‍යවශ්‍ය කටයුත්තක් වේ. මේ සඳහා තම ව්‍යාපාරය වෙත පැමිණෙන පාර්භෝගිකයන් තෘප්තිමත් කිරීම අනිවාර්ය කටයුත්තක් වුවත් ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නොදැනුවත්කම හා ඇතැම් ක්‍රියාකලාපයන් හේතුවෙන් විශාල පාරිභෝගිකයන් ප්‍රමාණයක් අහිමි කර ගැනීමක් සිදුවන බව අපගේ නිරීක්ෂණයට ලක් විය.

ඒ අනුව මාතර දිස්ත්‍රික්කයේ තෝරා ගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සහ මාතර දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරුවන් සඳහා "පාරිභෝගික සත්කාරය සහ නායකත්වය" පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් 2019 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර ආරක්ෂක සේවා පාලක ලුතිතන් කර්නල් (විශ්‍රාමික) චන්දන වීරකෝන් මහතා විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදී.



චන්දන වීරකෝන් මහතා විසින් දේශනය පවත්වමින්



පාරිභෝගික සත්කාරය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකමක නිරත වෙමින්



පාරිභෝගික සත්කාරය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකමක නිරත වෙමින්



ව්‍යවසායිකාවක් විසින් වැඩසටහන පිළිබඳ අදහස් දක්වමින්

# රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජන දිරිගන්වමින්....

රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම මගින් ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් මහජනතාවට සම්ප්‍රේෂණය කරවීම අරමුණු කොටගෙන මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත මාණ්ඩලික නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා "රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ" පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ඔක්තෝබර් මස 07 වන දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු කෙරිණි. නිලධාරීන් 162 දෙනෙකු සහභාගී වූ මෙම වැඩසටහනට ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කළමණාකරු එච්.එම්.සී.කේ. හේරත් මහතා විසින් සම්පත් දායකත්වය සපයන ලදී. මෙහි සමාරම්භක අවස්ථාවට මාතර අතිරේක දිස්ත්‍රික් ලේකම් - කසුන් වෙල්ලහේවා මහතා, මාතර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - එන්.පී.ජේ.පී. රෝහිත මහතා, අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) - සී.එම්.සිරිවර්ධන මහතා සහ අප ප්‍රාදේශීය කාර්යාලයේ සංවර්ධන අංශ ප්‍රධානී ජ්‍යෙෂ්ඨ කළමනාකරු - සුමුදු ගුණරත්න මහතා සහභාගී වූහ.



සුමුදු ගුණරත්න මහතා වැඩසටහන් අරමුණේ පැහැදිළි කරමින්



වැඩසටහන සඳහා සහභාගී වූ නිලධාරීන්ගෙන් කොටසක්



එච්.එම්.සී.කේ. හේරත් මහතා දේශනය පවත්වමින්

# ව්‍යවහාර මුදල් නෝට්ටු හා එහි නීතිමය පසුබිම

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන සාප්පු, පෞද්ගලික රෝහල්, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා IOC සමාගමේ නියෝජිතායතන සහ සිංගර් පී.එල්.සී. සමාගමේ ප්‍රදර්ශනාගාරවල මුදල් අයකැමිවරුන් සඳහා "ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ජූලි මස 29 වන දින ගාල්ල - කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා 110 දෙනෙක් සහභාගී වූහ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඒ.එම්. ගුණතිලක මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී පී.එම්. විජේසිරි මහතා විසින් මුදල් නෝට්ටුවල ඇතුළත්ව ඇති ආරක්ෂක සළකුණු හඳුනා ගැනීම, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම, පිරිසිදු මුදල් පරිහරණය සහ පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය පිළිබඳ හඳුන්වාදීම සිදු කරන ලද අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන අංශයේ බී.ඒ.ඩී. සමීර මහතා විසින් මුදල් ව්‍යාජකරණයේ නීතිමය තත්ත්වයන් පැහැදිලි කිරීම සිදු කරන ලදි.



මිගාර හඳුන්ගේ මහතා වැඩසටහන් අරමුණ පැහැදිලි කරමින්



ඒ.එම්. ගුණතිලක මහතා දේශනය පවත්වමින්



පී.එම්. විජේසිරි මහතා දේශනය පවත්වමින්



බී.ඒ.ඩී. සමීර මහතා දේශනය පවත්වමින්



පැමිණි පිරිස මුදල් නෝට්ටුවල ආරක්ෂක සලකුණු පිරික්සමින්

# අධික ණය වීමේ ආදීනව

මූල්‍ය සේවාවන් ලබා ගැනීමට අපහසු ග්‍රාමීය ප්‍රජාවන් අතර ඇති අධික ණයගැතිභාවයට විසඳුම් ලබා දීමේ හා ඉන් වැළැක්වීමේ අරමුණින් අප ප්‍රාදේශීය කාර්යාලය දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ජූලි මස 05 වන දින මාතර තිහගොඩ නාරංගල විහාරස්ථානයේ දී 84 ක පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙහි දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා විසින් මුදල් කළමනාකරණය කර ගන්නා ආකාරය, ඉතිරිකිරීම් දිරිගැන්වීම, ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය, ණය ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු, නිවැරදි ණය භාවිතය සහ ණය උගුල්වලින් මිදීම පිළිබඳ දැනුවත් කරන ලදී.



නාරංගල ග්‍රාම නිලධාරීතුමන් පැමිණි පිරිස පිළිගනිමින්



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා දේශනය පවත්වමින්



සහභාගී වූ පිරිසෙන් අයෙක් වැඩසටහන පිළිබඳව තම අදහස් දක්වමින්



තිහගොඩ - අපනයන සංවර්ධන නිලධාරිනී වැඩසටහන පිළිබඳ අදහස් දක්වමින්



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා හරවත් දේශනයක් සඳහා ශ්‍රව්‍යය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කර ගනිමින්දේශනය පවත්වමින්

# පැවැත්ම හා දියුණුව සඳහා විධිමත් මූල්‍යමය ප්‍රවේශයට උපදෙස්

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය අතරමැදිකරණය, බැංකු හා මූල්‍ය සේවා පරිසරය හඳුනා ගැනීම, ආයෝජනයන් සිදුකිරීමේ දී විධිමත් ආයතන තෝරා ගැනීම, අවිධිමත් මූල්‍ය ආයතන හඳුනා ගැනීම සහ ඒවායෙන් ඇති කළ හැකි අහිතකර තත්ත්වයන් පිළිබඳව දකුණු පළාතේ රාජ්‍ය නිලධාරීන්ගේ, ව්‍යවසායකයින්ගේ සහ මහජනතාවගේ දැනුම වර්ධනය කිරීමටත් ඔවුන්ට පහසුවෙන් විධිමත් මූල්‍යමය ප්‍රවේශය ලබා ගැනීමට උපදෙස් ලබාදීමත් අරමුණු කර ගෙන වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබා දීම අප ප්‍රාදේශීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා විසින් සිදු කරන ලදී.

***01. මාතර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහයෝගය ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වැඩසටහන් 02 ක් සංවිධානය කරන ලදී.***





*ජූලි මස 09 දින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 41 ක් සඳහා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පැවැත් වූ වැඩසටහන*





*සැප්තැම්බර් මස 05 දින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 71 ක් සඳහා අකුරැලිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පැවැත් වූ වැඩසටහන*

> *"Small opportunities are often the beginning of great enterprises."*
>
> ***Demosthenes***

## පැවැත්ම හා දියුණුව සඳහා විධිමත් මූල්‍යමය ප්‍රවේශයට උපදෙස්

02. 2019 දකුණු පළාත් සංවර්ධන දිනයට සමගාමීව වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සියලුම ග්‍රාම සමිති නියෝජනය වන පරිදි සාමාජිකයින් හා මහජනතාව උදෙසා වැඩසටහනක් පවත්වන ලදී.





ජූලි මස 26 දින වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව 225ක පිරිසක් සඳහා ගුරුසිංහගොඩ දීපාරාම විහාරස්ථානයේ පැවැත් වූ වැඩසටහන

03. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගය ඇතිව එහි නිලධාරීන්, ප්‍රදේශයේ ව්‍යවසායකයන් ඇතුළු මහජනතාව උදෙසා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 ක වැඩසටහන් සංවිධානය කරන ලදී.





අගෝස්තු මස 05 දින වීරකැටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 100ක පිරිසක් සඳහා පැවැත් වූ වැඩසටහන





අගෝස්තු මස 27 දින කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 201ක පිරිසක් සඳහා පැවැත් වූ වැඩසටහන

# පැවැත්ම හා දියුණුව සඳහා විධිමත් මූල්‍යමය ප්‍රවේශයට උපදෙස්




සැප්තැම්බර් මස 10 දින දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 130ක පිරිසක් සඳහා පැවැත් වූ වැඩසටහන




ඔක්තෝබර් මස 03 දින තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 95ක පිරිසක් සඳහා පැවැත් වූ වැඩසටහන

04. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සහයෝගය ඇතිව කුඩාවැල්ල ප්‍රදේශයේ ධීවර කාන්තාවන් සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී.




නොවැම්බර් මස 26 දින තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 46ක පිරිසක් සඳහා පැවැත් වූ වැඩසටහන

# CA Orator - කථික තරගාවලියේ තරඟකරුවන් දැනුවත් කරමින්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වාණිජ අංශයේ සහයෝගය ඇතිව සංවිධානය කරන ලද **"CA Orator"** කථික තරගාවලියේ අවසන් තරඟකරුවන් 38 දෙනෙකු සඳහා "විධිමත් මූල්‍ය ආයතන, මූල්‍ය සේවා සහ මූල්‍ය කළමනාකරණය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ජූලි මස 04 වන දින දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා විසින් ප්‍රධාන වශයෙන් "විධිමත් මූල්‍ය ආයතන, මූල්‍ය සේවා, මූල්‍ය කළමනාකරණය සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා" පිළිබඳව ද වරලත් ගණකාධිකාරී උපේන්ද්‍ර විජේසිංහ මහතා විසින් "නායකත්වය සඳහා මූල්‍ය කළමනාකරණයේ කාර්යභාරය" පිළිබඳව ද දැනුවත් කිරීම් සිදු කරන ලදී.



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා දේශනය පවත්වමින්



ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා දේශනය පවත්වමින්

# ව්‍යවහාර මුදල් කෞතුකාගාරය හා සමගාමී අධ්‍යාපනික වැඩසටහන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ඇති ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කළ කාසි හා නෝට්ටු සහ වර්තමානයේ භාවිතා වන කාසි හා නෝට්ටු, ක්‍රිස්තු පූර්ව තුන්වන ශත වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් භාවිතය, අනුරාධපුර, පොළොන්නරු, කෝට්ටේ හා මහනුවර රාජධානි යුගවල භාවිත කෙරුණු කාසි හා නෝට්ටු සහ ශ්‍රී ලංකාවේ අධිරාජ්‍යවාදී පාලන සමයේ භාවිතා වූ ව්‍යවහාර මුදල් ප්‍රදර්ශනයට තබා ඇත. නොමිලේ නැරඹීමේ පහසුකම් ඇති මෙය සඳුදා සිට සිකුරාදා දක්වා (පෝය හා බැංකු නිවාඩු හැර) උදෑසන 9.00 සිට සවස 4.00 දක්වා විවෘත ව පවතී.

පාසල් සිසුන් සඳහා මෙම කෞතුකාගාරය නැරඹීමට සමගාමීව අප ප්‍රාදේශීය කාර්යාලය තුළ අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එහි දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් භාවිතය, විධිමත් බැංකුකරණය, විධිමත් මූල්‍ය ආයතන, මූල්‍ය සේවා පිළිබඳව සහ ශ්‍රී ලංකා ආර්ථිකය වැනි මාතෘකා යටතේ දේශණ පවත්වනු ලැබේ. 2019 වසරේ දෙවන අර්ධය තුළ පැවැත් වූ මෙවැනි වැඩසටහන් සඳහා ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා සහ කළමනාකාරිණී යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදී.

***<u>01. අගෝස්තු මස 29 වන දින කොටපොල සිසුමග අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 38ක් සඳහා වූ වැඩසටහන.</u>***



**කළමනාකාරිණී යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි දේශනය පවත්වමින්**




**ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා දේශනය පවත්වමින්**

***02. සැප්තැම්බර් මස 11 වන දින තංගල්ල බාලිකා විද්‍යාලයේ ශිෂ්‍යාවන් 48ක් සඳහා වූ වැඩසටහන.***



**කළමනාකාරිණී යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි දේශනය පවත්වමින්**



**ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා දේශනය පවත්වමින්**

# ව්‍යවහාර මුදල් කෞතුකාගාරය හා සමගාමී අධ්‍යාපනික වැඩසටහන්

03. ඔක්තෝබර් මස 15 වන දින මිරිජ්ජවිල මහා විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 59ක් ව්‍යවහාර මුදල් කෞතුකාගාරය විසිත්ත කළ අවස්ථාව.



සිසු සිසුවියන් ව්‍යවහාර මුදල් කෞතුකාගාරය නරඹමින්


කළමනාකාරිණී යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි දේශනය පවත්වමින්

04. ඔක්තෝබර් මස 23 වන දින මාර/කොටුව ජනාධිපති විද්‍යාලයේ උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 38ක් සඳහා වූ වැඩසටහන.





ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා දේශනය පවත්වමින්

> *"Growth is Never by mere chance; it is the result of forces working together"*
>
> ***James Cash Penney***

# ව්‍යවහාර මුදල් කෞතුකාගාරය හා සමගාමී අධ්‍යාපනික වැඩසටහන්

05. ඔක්තෝබර් මස 23 වන දින මාර/කොටුව ජනාධිපති විද්‍යාලයේ උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 38ක් සහ 10 ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 18ක් ව්‍යවහාර මුදල් කෞතුකාගාරය විසිත්ත කළ අවස්ථාව.



සිසු සිසුවියන් ව්‍යවහාර මුදල් කෞතුකාගාරය නරඹමින්



කළමනාකාරිණි යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි දේශනය පවත්වමින්

07. නොවැම්බර් මස (07) වන දින මාර/ඉල්මා විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40ක් ව්‍යාවහාර මුදල් කෞතුකාගාරය විස්ත්ත කල අවස්ථාව.



සිසු සිසුවියන් ව්‍යවහාර මුදල් කෞතුකාගාරය නරඹමින්



කළමනාකාරිණි යූ.ඩබ්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය, ව්‍යවහාර මුදල් කෞතුකාගාරයෙහි දේශනය පවත්වමින්

> *"We are products of our past,but we don't have to be prisoners of it"*
>
> ***Rick Warren***

## මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය ගාල්ල, මාතර, හම්බන්තොට හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නගා සිටු වීම සඳහා පසුගිය වර්ෂ කිහිපය තුළ වැඩසටහන් රාශියක් පවත්වන ලදී. එහිදී අප විසින් එම වැඩසටහන්වලට සහභාගී වූ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර පිළිබඳ පසු විපරම් කටයුතු නිරන්තරයෙන් සිදු කර ඔවුන්ගේ ඉදිරි ව්‍යාපාරික දියුණුවට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා දෙනු ලබයි. ඒ අනුව, අප විසින් සිදු කරනු ලැබූ පසු විපරම් කටයුතු පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

### හිරු ෆැෂන් (පුද්ගලික) සමාගම

2019 පෙබරවාරි මස 28 වන දින මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ ව්‍යාපාර ඩිජිටල්කරණය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ නො. 02, දන්කැටිය වත්ත, බතීගම බටහිර, දික්වැල්ල යන ලිපිනයේ සිය ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන කේ. ඩබ්. කේ. රාජිකා ප්‍රියංගනී මහත්මිය අයත් හිරු ෆැෂන් (පුද්ගලික) සමාගම පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු එම්. එස්. හඳුන්ගේ මහතාගේ සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මයාගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් මස 19 වන දින සිදු කරන ලදී.





### මලිඳු කිතුල් නිෂ්පාදන

2019 පෙබරවාරි මස 28 වන දින මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ ව්‍යාපාර ඩිජිටල්කරණය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ කටුවන්දෙනිය වත්ත, කැටන්විල, මලිදුව, අකුරැස්ස යන ලිපිනයේ පදිංචි සහන් අනුරුද්ද මහතාට අයත් මලිඳු කිතුල් නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මයාගේ සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මයාගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් මස 19 වන දින සිදු කරන ලදී.





# මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

## ළහිරු පැළ තවාන

2017 මාර්තු මස 24 හා 25 යන දිනයන්හි අම්බලන්තොට පැවති වෙළඳපොළ සම්බන්ධීකරණ වැඩසටහන, වෙළඳ සල්පිල හා අලෙවි ප්‍රදර්ශනයට සහ 2019 ජූනි මස 25 වන දින පැවති මිරිජ්ජවිල උද්භිත උද්‍යානය ආශ්‍රිත ක්ෂේත්‍ර චාරිකාව සහ බොන්සායි තාක්ෂණය හඳුන්වා දීමේ පුහුණු වැඩසටහනට සහභාගී වූ අනෝදාව, රත්න පාර, විරකැටිය යන ලිපිනයේ පදිංචි කලන දිශාන් එදිරිසිංහ ගුණවර්ධන මහතාට අයත් ළහිරු පැළ තවාන පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මයාගේ සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මයාගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් මස 26 වන දින සිදු කරන ලදී.





## තිසාරා අත්කම්

2017 මාර්තු මස 24 හා 25 යන දිනයන්හි අම්බලන්තොට පැවැතිවෙළඳපොළ සම්බන්ධීකරණ වැඩසටහන, වෙළඳ සල්පිල හා අලෙවි ප්‍රදර්ශනයට සහ 2017 මාර්තු මස 31, අප්‍රේල් 01 හා 02 යන දිනයන්හි මාතර පැවති වෙළඳපොළ සම්බන්ධීකරණ වැඩසටහන, වෙළඳ සල්පිල හා අලෙවි ප්‍රදර්ශනයට සහභාගී වූ ආස්වැලහේන, ඔව්ලාන, විජයසිරිපුර, වලස්මුල්ල යන ලිපිනයේ පදිංචි එච්. එස්. චන්දිම දිනූෂ කුමාර මහතාට අයත් තිසාරා අත්කම් පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මයාගේ සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මයාගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් මස 26 වන දින සිදු කරන ලදී





## මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

# K & D Lace Creations

හබරාදුව, කටුකුරුන්ද, ඉසුරු පෙදෙසෙහි ඇති, පී.එම්.උදේනි දීපිකා ද සිල්වා මහත්මියට අයත් K & D Lace Creation ව්‍යාපාරයේ පසුවිපරමක් 2019 නොවැම්බර් මස 14 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු, මිගාර හඳුන්ගේ මහතාගේ සහ කළමනාකාර සහකාර, පී.එල්.පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. මෙම ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් ම බීරළු රේන්ද ආශ්‍රිත නිෂ්පාදනය, අලෙවිය හා අපනයනය, අත් රේන්ද ආශ්‍රිත නිෂ්පාදනය සහ එම්බ්‍රොයිඩර් ආශ්‍රිත නිෂ්පාදනය සිදු කරන අතර අප ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පැවති වෙළඳ ප්‍රදර්ශනවලට මෙම ව්‍යවසායිකාව සහභාගී වී නව ගනුදෙනුකරුවන් හඳුනා ගෙන ඇති අතර ම ඒවා මගින් විශාල ආදායමක් උපයා ගෙන තිබේ. තව ද, මෙම ව්‍යවසායිකාව අප විසින් සංවිධානය කරන ලද එක් දින බෑග් පුහුණු වැඩසටහනකට සම්බන්ධ වීම මගින් බීරළු රේන්ද ආශ්‍රිත බෑග් නිෂ්පාදනයට ද යොමු වී තිබේ. වර්තමානයේ දී නුගේගොඩ ප්‍රදේශයේ මංගල සාරි නිෂ්පාදන ආයතනයකට බීරළු රේන්ද සැපයුම්කරු ලෙස ද ලක්සල, ලක් ආර්කේඩ් වැනි ආයතනවලට බීරළු රේන්ද ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරුවෙකු ද ලෙස ක්‍රියා කරයි.





දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් නදුන් ගුරුගේ මහතා අදහස් දක්වමින්

# P & S Spices

ගාල්ල, වැලිපත, මොරිස් පාරෙහි ඇති, ශිරෝමා ප්‍රනාන්දු මහත්මියට අයත් **P & S Spice** ව්‍යාපාරයේ පසුවිපරමක් 2019 නොවැම්බර් මස 14 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු, මිගාර හඳුන්ගේ මහතාගේ සහ කළමනාකාර සහකාර, පී.එල්.පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. කෘතිම රසකාරක සහ වර්ණක භාවිත නොකර නියමිත ප්‍රමිතීන්ට අනුව, ඉතා පිරිසිදුව හා විශ්වාසවන්තව පාරිභෝගිකයන්ට සැපයීමේ අරමුණෙන් "ගමේ රසය නගරේ සැමට" යන තේමාව යටතේ සියලුම කුළුබඩු වර්ග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කරයි. කහ, මිරිස් කුඩු, මිරිස් කෑලි, අමු තුනපහ කුඩු, මස්කරි, ගම්මිරිස් කුඩු, බැදපු තුනපහ, බැදපු උළුහාල්, අබ කුඩු සහ බිරියානි පවුඩර්, කොත්තමල්ලි පානය වැනි අගය එකතු කළ නිෂ්පාදන රැසක් **P & S Spice** නාමය යටතේ නිපද වේ. මෙම කොත්තමල්ලි පානය සකසා ඇත්තේ කොත්තමල්ලි, ඉඟුරු හා තිප්පිලි නියමිත ප්‍රමාණයන් ගෙනි. තව ද, පාරිභෝගික ඉල්ලීම මත හෝ ප්‍රදර්ශනයන්හි අලෙවිය සඳහා චට්නි වර්ග, මාළු ඇඹුල්තියල්, උම්බලකඩ සම්බෝලය හා හාල්මැස්සන් බැදුම සකස් කරනු ලැබේ. අප විසින් සංවිධානය කරන ලද ඇසුරුම්කරණය, අලෙවිකරණය, පිරිවැය ගණනය යනාදිය පිළිබඳව වූ වැඩසටහන්වලට සම්බන්ධ වීම මගින් ලබාගත් දැනුම ව්‍යාපාරය දියුණුව සඳහා උපකාර කරගත් මෙම ව්‍යවසායිකාව මේ වන විට, කොත්තමල්ලි පානය කුඩා ටී බෑගයක ආකාරයෙන් නිපදවීම සඳහා සාම්පල් පරීක්ෂාවට ගන්නෝරුවට යවා ඇත. අප ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පැවති වෙළඳ ප්‍රදර්ශනවලට මෙම ව්‍යවසායිකාව සහභාගී වී නව ගනුදෙනුකරුවන් හඳුනා ගෙන ඇති අතර ම ඒවා මගින් විශාල ආදායමක් උපයා ගෙන තිබේ. තව ද, වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා නිෂ්පාදන ඉදිරිපත් කළ යුතු ආකාරය හා නියමාකාරයෙන් ආකර්ශනීය වෙළඳ කුටි පවත්වාගෙන යන ආකාරය පිළිබඳව දැනුම වැඩි දියුණු කරගැනීමට ද එම වෙළඳ ප්‍රදර්ශන ඇයට බෙහෙවින් උපකාරී වී තිබේ.





## මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

### රුවීනා නිෂ්පාදන ව්‍යාපාරය

ගාල්ල, ශ්‍රී සුමේධ මාවතේ, අංක 9/2 ස්ථානයේ ඇති, තුසිතා දිල්රුක්ෂි විජේසේකර මහත්මියට හා ජේ.එම්.කරුණාරත්න මහතාට අයත් "රුවීනා නිෂ්පාදන" ව්‍යාපාරයේ පසුවිපරමක් 2019 නොවැම්බර් මස 14 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු, මිගාර හඳුන්ගේ මහතා සහ කළමනාකාර සහකාර, පී.එල්.පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. "වස විසෙන් තොර හෙටක්" යන දැක්මෙන් යුතු මෙම ව්‍යාපාරය **SLS** ආයතනය මගින් ලබාදෙන **GMP** තත්ත්ව සහතිකය ලබා ගෙන තිබෙන අතර ප්‍රධාන වශයෙන් මෙම ව්‍යාපාරය දේශීය පළතුරු ආශ්‍රිත නිෂ්පාදන සිදු කරයි. අප ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පැවති වෙළඳ ප්‍රදර්ශනවලට මෙම ව්‍යවසායකයින් සහභාගී වී නව ගනුදෙනුකරුවන් හඳුනා ගෙන ඇති අතර ම ව්‍යාපාරයේ දියුණුවට එය මහත් රුකුලක් වී ඇත. අප විසින් සංවිධානය කරන ලද ගිණුම්කරණය, පිරිවැය ගණනය, සේවක ඵලදායිතාවය, නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය හා ධාරිතා සංවර්ධනය ආදිය පිළිබඳව වූ වැඩසටහන්වලට සම්බන්ධ වීම මගින් ලබාගත් දැනුම ව්‍යාපාරය දියුණුව සඳහා උපකාර කරගත් මෙම ව්‍යවසායකයින් දකුණු පළාත් කාෂිකර්ම අමාත්‍යාංශය මගින් තේරූ 2019 වසරේ දකුණු පළාත් විශිෂ්ඨතම ව්‍යවසායකයා සම්මානය හිමිකර ගෙන තිබේ.





### සුසිනිදු බේබි කෙයාර් ව්‍යාපාරය

කඹුරුපිටිය, උල්ලල. "අනුජය"හි ඇති, අනුෂා ඉන්දුකුමාරි වර්ණකුල මහත්මියට අයත් "සුසිනිදු බේබි කෙයාර්" ව්‍යාපාරයේ පසුවිපරමක් 2019 නොවැම්බර් මස 28 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු, මිගාර හඳුන්ගේ මහතාගේ සහ කළමනාකාර සහකාර, පී.එල්.පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ ළදරු ගිම් ඇඳුම් වෙළඳපොළ තුළ ප්‍රමුඛතම සන්නාමය ලෙස සුසිනිදු බේබි කෙයාර් නාමය රඳවා තැබීම යන දැක්මෙන් යුතු මෙම ව්‍යාපාරය, ළදරුවන්ට අවශ්‍ය සියලුම ඇඳුම් වර්ග, ළදරුවන් රැගෙන යන බෑගය, මව්වරුන්ට අවශ්‍ය ඇඳුම් ආදිය නිෂ්පාදනය කරයි. අප ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පැවති වෙළඳ ප්‍රදර්ශනවලට මෙම ව්‍යවසායිකාව සහභාගී වී නව ගනුදෙනුකරුවන් හඳුනා ගෙන ඇති අතර ම ඒවා මගින් විශාල ආදායමක් උපයා ගෙන තිබේ. තව ද, මෙම වසරේ පැවත්වූ ව්‍යාපාර ඩිජිටල්කරණය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන හා සම්බන්ධ විණි. මෙම ව්‍යවසායිකාව විසින් 2019 දකුණු පළාත් ව්‍යවසායක සම්මාන උළෙලේ දී විශේෂ ක්‍රියාකාරීත්වය යන අංශය යටතේ "විශිෂ්ඨතම පරිසර හිතකාමී ව්‍යාපාරය" සම්මානය හිමිකර ගෙන තිබේ.





## මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

### ජයති ඇක්වේරියම්

2019 ජූනි 06 වන දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ භාණ්ඩ ආනයන අපනයන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වූ ව්‍යවසායකයෙකු වන පී.එච්. පුබුදු චන්ද්‍රිමාල් ජයසිංහ මහතා විසින් වැව රථුම, දිවිතුර, ඇත්කඳුර යන ලිපිනයෙහි ඉතා සාර්ථක ලෙස පවත්වා ගෙන යනු ලබන ''ජයති ඇක්වේරියම්'' නම් මත්ස්‍ය වගා ගොවිපොළ පිළිබඳව පසුවිපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්.පී.අනුර මහතා සහ කළමනාකාර සහකාර කේ.කේ.කේ.ඩී. කොළඹගේ මෙනෙවියගේ සහභාගිත්වයෙන් 2019 දෙසැම්බර් මස 16 වැනි දින සිදු කරන ලදී.

මේ වන විට දේශීය ගැනුම්කරුවන් ඉලක්ක කරගනිමින් විදේශීය වෙළඳපොළට මත්ස්‍යයින් අලෙවි කරන අතර, අප විසින් සංවිධානය කළ වැඩසටහනින් පසු සෘජු අපනයනය පිළිබඳව අවබෝධයක් සහ උනන්දුවක් ඇති වී ඇත. ඒ ඔස්සේ විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් ''ජයති ඇක්වේරියම් '' නමින් සෘජුවම විදේශීය ගැනුම්කරුවන් ඉලක්ක කර අපනයනය කිරීම ව්‍යවසයකයාගේ අපේක්ෂාවයි. විවිධ අපනයන ක්‍රම, අපනයනය සඳහා බලාත්මක වන නීති රෙගුලාසි සහ මසුන් අපනයනය සඳහා ඇසුරුම් කිරීමේ ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා ඇත.



මඩ පොකුණු 6 කින් යුත් මත්ස්‍ය වගාව ඉදිරිපිට.



මත්ස්‍යයින් සඳහා ආහාර ලබා දෙන අවස්ථාවක්

### අම්බලන්ගොඩින් දේශීය අත්යන්ත්‍ර සළු පිළි - (DHD) හෑන්ඩ්ලූම්"

2017 වර්ෂයේ සිට මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් පවත්වනු ලැබූ විවිධ වැඩසටහන් සහ අලෙවි ප්‍රදර්ශන සඳහා සහභාගී වූ ව්‍යවසායිකාවක් වශයෙන් අප හඳුනාගත් යූ.ඩබ්.ඉරේෂා දිල්හානි මෙත්මියට අයත් **DHD** හෑන්ඩ්ලූම් ආයතනය පිළිබඳව පසුවිපරමක් 2019.12.16 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්.පී අනුර මහතා සහ කළමනාකාර සහකාර කේ.කේ.කේ.ඩී. කොළඹගේ මෙනෙවියගේ සහභාගිත්වයෙන් අම්බලන්ගොඩ නගරයේ පිහිටි **DHD** හෑන්ඩ්ලූම්'' අලෙවිසැල සහ විස්කම් පෙදෙස, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ යන ලිපිනයෙහි පිහිටි නිෂ්පාදනාගාරය ආශ්‍රිතව සිදු කෙරුණි.

අපගේ වැඩසටහන් සඳහා සහභාගී වීමෙන් පසුව විශාල පාරිභෝගික පිරිසක් හඳුනාගෙන ඇති අතර, ක්ෂේත්‍රයේ නියුතු වෙනත් නිෂ්පාදකයින් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට ද හැකියාව ලැබී ඇත. මේ වන විට දේශීය ගැනුම්කරුවන් මෙන්ම විදේශීය සංචාරකයින් ද ඉලක්ක කරමින් නිෂ්පාදන කටයුතු ව්‍යාප්ත කරගෙන ඇත. දේශීය තාක්ෂණය භාවිතා කරමින් ඉතා ඉහළ ගුණාත්මක නිෂ්පාදන නිමවීම සිය ගැනුම්කරුවන් දිගු කාලීනව රඳවා ගැනීමට හේතු වී ඇත. ඇයගේ නිමැවුම් (**www.dhdhandloom.lk**) යන වෙබ් අඩවිය ඔස්සේ ප්‍රදර්ශනය කෙරේ.



ව්‍යවසායිකාව සිය නිෂ්පාදන පිළිබඳව විස්තර කරමින්



අත් යන්ත්‍ර මඟින් සාරියක් නිෂ්පාදනය කරමින්

## මාතර ප්‍රාදේශීය කාර්යාල සෙවනේ වැඩෙන ව්‍යවසායකයෝ.

### චාතූර්යා ෂූ මාර්ට් ව්‍යාපාරය

අකුරැස්ස, තිබ්බොටුවාව, පල්ලගේතුඩුවේහි, අංක 91/6 දරන ස්ථානයේ ඇති, එම්.එම්. සුභද්‍රා සංජීවනී මහත්මියට අයත් "චාතූර්යා ෂූ මාර්ට්" ව්‍යාපාරයේ පසුවිපරමක් 2019 නොවැම්බර් මස 28 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු, මිගාර හඳුන්ගේ මහතා සහ කළමනාකාර සහකාර, පී.එල්.පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. "සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ දෙපා සරසමින් සුරකින හිමිකාරිය බවට පත්වීම" යන දැක්මෙන් යුතු මෙම ව්‍යාපාරය, වර්තමානය වන විට දිවයින පුරා ව්‍යාප්ත අලෙවි ජාලයක් සඳහා කාන්තා හා ළමා පාවහන් නිෂ්පාදනය කරයි. අප ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පැවති වෙළඳ ප්‍රදර්ශනවලට මෙම ව්‍යවසායිකාව සහභාගී වී නව ගනුදෙනුකරුවන් හඳුනා ගෙන ඇත. අප ප්‍රාදේශීය කාර්යාලය මගින් සංවිධානය කර, 2019 ජනවාරි මස 30 දින සිට පැවැත් වූ තෙදින පුහුණු වැඩසටහන මගින් තම දැනුම බෙදා හරිමින් නවත් පිරිසකට මෙවැනි ව්‍යාපාරවල යෙදීමට මග පෙන්වා දීමට මෙම ව්‍යවසායිකාවට හැකි විනි. අප ප්‍රාදේශීය කාර්යාලය විසින් 2019 වසරේදී රුහුණු විශ්වවිද්‍යාලය හා සම්බන්ධව පැවැත්වූ "විශ්වවිද්‍යාල සිසුන් හරහා ව්‍යවසායකයන් හට අලෙවිකරණ උපායමාර්ග නිර්මාණය කිරීමේ වැඩමුළුව" සඳහා ද සහභාගී විය.





## විශේෂ අවස්ථා

### 1) ව්‍යවසායක සම්මාන ප්‍රදානෝත්සවය - 2019

හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබූ දකුණු පළාත් විශිෂ්ට ව්‍යවසායකයා 2019 සම්මාන උළෙල, දෙසැම්බර් 17 දින මාතර, සනායා මැන්ෂන් හෝටලයේ දී පැවැත්විණි. මෙම වැඩසටහනෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන හා සැපයුම් කළමනාකරණ අමාත්‍ය විමල් වීරවංශ මහතා සහභාගී වූ අතර අප ප්‍රාදේශීය කළමනාකරු - මිගාර හඳුන්ගේ මහතා එහි විශේෂ ආරාධිතයෙක් වශයෙන් සහභාගී විය. මෙම සම්මාන උළෙල පැවැත්වීමේ අරමුණ වී ඇත්තේ පළාතේ සුවිශේෂී ව්‍යවසායකයන් හඳුනාගෙන ඔවුන් වෙත ත්‍යාග ප්‍රදානය කිරීම හරහා පළාත තුළ ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකයන්ගේ දායකත්වය නංවාලීම සඳහා ඔවුන් උනන්දු කරවීම, දිරි ගැන්වීම සහ ඔවුනට අදාළ ඒ ඒ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වය සොයා යනු පිණිස ව්‍යවසායකයන් උත්තේජනය කරලීමයි.

මෙම සම්මාන උළෙලේ දී විශාල පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ හා ක්ෂුද්‍ර පරිමාණ යන ව්‍යවසායක ඛාණ්ඩ සඳහා කර්මාන්ත හා නිෂ්පාදන අංශය, සේවා අංශය සහ සත්ත්ව පාලන අංශය යන අංශ තුන යටතේ සම්මාන ලබාදෙන ලදී.



මධ්‍යම පරිමාණ සේවා අංශයේ විශිෂ්ටතම ව්‍යවසායකයාට හිමි සම්මානය
ඒ.ජී. මහින් ප්‍රියන්ත මහතාට ලබා දෙමින්



මධ්‍යම පරිමාණ කර්මාන්ත සහ නිෂ්පාදන අංශයේ විශිෂ්ටතම ව්‍යවසායකයාට හිමි සම්මානය
ඒ.ඩබ්.එම්. අන්සාන් මහතාට ලබා දෙමින්



මධ්‍යම පරිමාණ සත්ත්ව පාලන අංශයේ විශිෂ්ටතම ව්‍යවසායකයාට හිමි සම්මානය
අචලා ප්‍රනාන්දු මහත්මියට ලබා දෙමින්

### 2) ආනයන හා අපනයන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය - 2019

සම්පත් බැංකුවේ ආනයන හා අපනයන ඒකකය මගින් සංවිධානය කරනු ලැබූ දකුණු පළාතේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් ආනයන හා අපනයන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක්, නොවැම්බර් මස 07 දින වැලිගම මන්දරා රෙසෝට් හෝටලයේ දී පැවැත් වූ අතර අප ප්‍රාදේශීය කළමනාකරු - මිගාර හඳුන්ගේ මහතා එහි විශේෂ ආරාධිතයෙක් වශයෙන් සහභාගී විය. "ඔබේ දියුණුවට අපේ මග පෙන්වීම" යන්න තේමාව කරගත් මෙම සම්මන්ත්‍රණයට සම්පත්දායකයන් ලෙස රාජ්‍ය අංශය නියෝජනය කරමින් විද්වතුන් රැසක් හා දකුණු පළාතේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් රැසක් සහභාගී වූහ.



# දකුණු පළාතේ ව්‍යවසායකයන් නගා සිටුවීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලයෙන් නව වැඩපිළිවෙලක්...

ශ්‍රී ලංකා මහ බැංකුව මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් 2020 වර්ෂයේ දී පැවැත්වීමට යෝජිත සංවර්ධන වැඩසටහන් පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල අදහස් හා යෝජනා ලබා ගැනීමේ අරමුණින් 2019 නොවැම්බර් මාසයේ දී ආයතන කිහිපියක් සමග සාකච්ඡා පවත්වන ලද අතර ඒ ඇසුරෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී.

## *1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ සිදු කරන ලද සාකච්ජාව*

ශ්‍රී ලංකා මහ බැංකුව මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නගා සිටුවීම සඳහා 2019 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් මාලාවක් ඉතා සාර්ථකව පවත්වන ලද අතර 2020 වර්ෂය තුළ දී ද එවැනි වැඩසටහන් මාලාවක් අප විසින් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.



ඒ අනුව, අප විසින් 2020 වර්ෂයේ දී පැවැත්විය යුතු පුහුණු වැඩසටහන්වල ස්වභාවය හඳුනා ගැනීම හා සංවිධානය කිරීම පිළිබඳ විශේෂ සාකච්ජාවක් 2019 නොවැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශිය කාර්යාල ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගාල්ල දිස්ත්‍රික් නියොජ්‍ය අධ්‍යක්ෂ පී. ඩබ්. පී. මංගලිකා මහත්මිය, මාතර දිස්ත්‍රික් නියොජ්‍ය අධ්‍යක්ෂ ඕ. පී. එස්. පෙරේරා මහත්මිය සහ හම්බන්තොට දිස්ත්‍රික් නියොජ්‍ය අධ්‍යක්ෂ එෆ්. ඩබ්. රාජපක්ෂ මහතා සහභාගී වූහ.

## *2. ෆ්‍රීලන් ආයතනය සමඟ සිදු කරන ලද සාකච්ජාව*



මාතර දිස්ත්‍රික්කයේ සාර්ථක ව්‍යාපාරයක් වන ෆ්‍රීලන් ආයතනය වර්තමානයේ මුහුණ දී ඇති ගැටළු හා අභියෝග හඳුනා ගැනීමත් එම ගැටළු සඳහා වන විසඳුම් විමසා බැලීමත් මෙන්ම ඒ සඳහා ලබා දිය හැකි ආයතනික සහයෝගය පිළිබඳ සාකච්ජාවක් 2019 නොවැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශිය කාර්යාල ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා ෆ්‍රීලන් ආයතනය නියෝජනය කරමින් එහි කළමනාකාර අධ්‍යක්ෂ බී. යූ. ජයරත්න මහතා සහ ප්‍රධාන ගණකාධිකාරී තුෂාර මහතා සහභාගී විය.

## *3. රුහුණු ප්‍රොඩියුස් ආයතනය සමඟ සිදු කරන ලද සාකච්ජාව*



රුහුණු ප්‍රොඩියුස් ආයතනය වර්තමානයේ මුහුණ දී ඇති ගැටළු හා අභියෝග හඳුනා ගැනීමත් එම ගැටළු සඳහා වන විසඳුම් විමසා බැලීමත් මෙන්ම ඒ සඳහා ලබා දිය හැකි ආයතනික සහයෝගය පිළිබඳ සාකච්ජාවක් 2019 නොවැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශිය කාර්යාල ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා රුහුණු ප්‍රොඩියුස් ආයතනය නියෝජනය කරමින් එහි කළමනාකාර අධ්‍යක්ෂ හිරංගා රුහුණගේ මහත්මිය සහභාගී විය.

# කාර්යමණ්ඩල වෙනස්වීම්...

2019 දෙසැම්බර් 12 දින සිට ජ්‍යෙෂ්ඨ කළමනාකරු
එම්.පී.අනුර මහතා අප කාර්යාලයට එක් වන ලදී.



2019 දෙසැම්බර් 15 දින සිට, මූල්‍ය සාක්ෂරතා/ සමීක්ෂණ සහ
ණය අංශයේ ප්‍රධානී යූ.ඩබ්ලිව්.ඒ.පී.කේ.වීරරත්න මහත්මිය
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට මාරු වීම් ලබන ලදී.



2019 ජූලි 15 දින සිට, කළමනාකරණ සහකාර
කේ.කේ.කේ.ඩී.කොළඹගේ මෙනවිය අප කාර්යාලයට එක් වන ලදී.



2019 සැප්තැම්බර් 02 දින සිට, කාර්යාල සහායක
ඩබ්ලිව්.ඒ.කේ.එස්. හසන්ත මහතා
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට මාරු වීම් ලබන ලදී.



2019 අගෝස්තු 15 දින සිට, කාර්යාල සහායක
ආර්.බී.වී. සාලින්ද මහතා අප කාර්යාලයට එක් වන ලදී.



## Get together 2019















## Get together 2019













# ශ්‍රී ලංකා මහ බැංකුව
# ප්‍රාදේශීය පුවත් - මාතර